ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | විනිමය පාලන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2012 අගෝස්තු 09 |

## අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) ගිණුම් වලින් අරමුදල් නිදහසේ මාරු කළහැක

එතෙර ආයෝජන ද ඇතුළුව විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් අතර අරමුදල් හුවමාරු කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස මෑතකාල වකවානුව තුළ විනිමය පාලන රෙගුලාසි සැළකිය යුතු අන්දමින් ලිහිල් කර ඇත. එකී අරමුණ පෙරදැරිව අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (**NRFC**) ගිණුම් හිමියන් විසින් ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණයක් නිදහසේ සිදු කළහැකි බව මනාව පැහැදිලි කිරීම සඳහා 2012.07.11 දිනැති විධානය සංශෝධනය කරමින් බලයලත් වෙළෙඳුන් වෙත අවශ්‍ය විධානයන් දැනටමත් නිකුත් කර ඇත.

එබැවින්, අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (**NRFC**) ගිණුම්වල පවත්නා අරමුදල් නිදහසේ පැවරීමේ හැකියාව සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් තවදුරටත් පැන නොනගිනු ඇත.